# CHEMISTRY

## MCQ Day

## Unit 14

ONE LAST TIME

REMEMBER WHY YOU STARTED !

Chemistry අමිල දසනායක

### කර්මාන්ත සහ පරිසරය

**41.** <u>කර්මාන්ත</u>

**1.**

| | |
|---|---|
| කාර්මික ක්‍රියාවලි කිහිපයකම කෝක් (Coke) භාවිත වේ. | කාර්මිකව කෝක් (Coke) භාවිත වන්නේ ඉන්ධනයක් ලෙස පමණි. |

**(2019-47)**

**2.** සමහර කාර්මික ක්‍රියාවලි හා සම්බන්ධව පහත දැක්වෙන කුමන ප්‍රකාශය / ප්‍රකාශ **නිවැරදි** වේ ද?

a) සෝල්වේ ක්‍රියාවලිය මගින් $Na_2CO_3$ නිෂ්පාදනය හා සම්බන්ධ පළමු පියවර දෙක තාප අවශෝෂක වේ.

b) බ්‍රයින්වල $Mg^{2+}$, $Ca^{2+}$ සහ $SO_4^{2-}$ අයන පැවතීම, පටල කෝෂ ක්‍රමය යොදා ගැනීමෙන් NaOH නිෂ්පාදනයට බාධා පමුණුවයි.

c) ඔස්වල්ඩ් ක්‍රමය මගින් නයිට්‍රික් අම්ල නිෂ්පාදනය හා සම්බන්ධ පළමු පියවර උත්ප්‍රේරකයක් හමුවේ වාතයේ ඇති $O_2$ මගින් $NH_3$ වායුව ඔක්සිකරණය කර $NO_2$ වායුව ලබාදීම වේ.

d) හේබර්-බොෂ් ක්‍රමය යොදා $NH_3$ වායුව නිෂ්පාදනයේ දී ඉහළ උෂ්ණත්ව හා අඩු පීඩන තත්ත්ව යොදාගනී.

**(2020-40)**

**3.**

| | |
|---|---|
| සල්ෆියුරික් අම්ල නිෂ්පාදනයේ දී $SO_3$ වායුව සහ ජලය අතර සිදුවන ප්‍රතික්‍රියාව තාප අවශෝෂක වේ. | $SO_3$ වායුව සාන්ද්‍ර $H_2SO_4$ සමග ප්‍රතික්‍රියා කළවිට ඕලියම් ලබා දේ. |

**(2020-47)**

**4.** දී ඇති කාර්මික ක්‍රියාවලි හා සම්බන්ධව පහත දැක්වෙන කුමන ප්‍රකාශය / ප්‍රකාශ **නිවැරදි** වේ ද?

a) ඩව් (Dow) ක්‍රමය මගින් Mg නිස්සාරණයේ දී අමුද්‍රව්‍යයක් ලෙස මුහුදු ජලය කෙලින්ම භාවිත කළ හැක.

b) NaOH නිෂ්පාදනය කිරීමේ දී රසදිය කෝෂවලට වඩා පටල කෝෂ භාවිතය පරිසර හිතකාමී වේ.

c) $Na_2CO_3$ නිෂ්පාදනයේ දී භාවිත වන සොල්වේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය ඇමෝනීකරණ අටළුව සිසිල් කිරීමෙන් වැඩි කරගත හැකිය.

d) ස්පර්ශ ක්‍රමය මගින් $H_2SO_4$ නිෂ්පාදනයේ දී උත්ප්‍රේරකයක් ලෙස Rh ලෝහය භාවිත කරයි.

**(2021-40)**

**5.**

| | |
|---|---|
| සොල්වේ ක්‍රියාවලිය මගින් $Na_2CO_3$ නිෂ්පාදනයේ දී ප්‍රධාන අතුරුඵලය $CaCl_2$ වේ. | සොල්වේ ක්‍රියාවලියේ දී $NH_3$ පුනර්ජනනය කිරීමට CaO භාවිත වේ. |

**(2021-47)**

**6.** දී ඇති කාර්මික ක්‍රියාවලිය හා සම්බන්ධව පහත දැක්වෙන කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

a) ධාරා ඌෂ්මකයක් මගින් යකඩ නිස්සාරණයේ දී භාවිත වන අමුද්‍රව්‍යයක් වන කෝක්, ඔක්සිහාරකයක් ලෙස පමණක් ක්‍රියා කරයි.

b) මැග්නීසියම් නිස්සාරණයේදී (Dow ක්‍රියාවලිය) භාවිත වන අමුද්‍රව්‍යයක්, විද්‍යුත් විච්ඡේදන පියවරේදී සෑදෙන අතුරුඵලයක් යොදාගනිමින් පුනර්ජනනය කළ හැක.

c) රූටයිල් භාවිත කරමින් සංශුද්ධතාවයෙන් ඉහළ $TiO_2$ නිෂ්පාදනයේදී, ක්ලෝරිනීකරණ පියවරේදී අකාබනික අපද්‍රව්‍ය ඉවත් වෙයි.

d) ඔස්වල්ඩ් ක්‍රමය භාවිතයෙන් නයිට්‍රික් අම්ලය නිෂ්පාදනයේ දී උත්ප්‍රේරකය ලෙස Fe භාවිත වේ.

**(2022-40)**

**7.**

| | |
|---|---|
| හේබර්-බෝෂ් ක්‍රමය මගින් $NH_3$ වායුව නිෂ්පාදනයේ දී $600\ ^0C$ ට වඩා ඉහළ උෂ්ණත්ව යොදාගනී. | හේබර්-බොෂ් ක්‍රමයෙන් $NH_3$ වායුව ලබාදෙන සමතුලිත ප්‍රතික්‍රියාවේ සක්‍රියන ශක්තිය උෂ්ණත්වය ඉහළ යාමේදී අඩු වේ. |

**(2022-49)**

**8.**

| | |
|---|---|
| ඔස්වල්ඩ් ක්‍රමය භාවිතයෙන් නයිට්‍රික් අම්ලය නිෂ්පාදනයේ දී $NH_3(g)$ සමග $O_2(g)$ ප්‍රතික්‍රියා කරවන උෂ්ණත්වයට වඩා වැඩි උෂ්ණත්වයකදී NO(g) සමග $O_{2(g)}$ ප්‍රතික්‍රියා කරවයි. | ඍණ එන්ට්‍රොපි වෙනසක් සහිත ප්‍රතික්‍රියා සඳහා ඉහළ උෂ්ණත්ව හිතකර නොවේ. |

**(2023-47)**

**9.**

| | |
|---|---|
| සල්ෆියුරික් අම්ලය නිෂ්පාදනයේදී, $SO_2(g)$ පියවර කිහිපයකින් $SO_3(g)$ බවට පරිවර්තනය කරනු ලැබේ. | සල්ෆියුරික් අම්ල නිෂ්පාදනයේ දී යොදා ගනු ලබන තත්ත්ව යටතේ දී එක් පියවරකින් $SO_2(g)$, $SO_3(g)$ බවට සම්පූර්ණයෙන් පරිවර්තනය කිරීම ස්වයංසිද්ධ නොවේ. |

**(2023-49)**

10. සමහර කාර්මික ක්‍රියාවලි සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ/ය **සත්‍ය** වේ ද?

a) හේබර්-බොෂ් ක්‍රියාවලියේ $N_2(g)$ සමඟ $H_2(g)$ ප්‍රතික්‍රියා කර $NH_3(g)$ සාදන ප්‍රතික්‍රියාව සඳහා එන්ට්‍රෝපි වෙනස ධන වේ. ($\Delta S > 0$).

b) හේබර්-බොෂ් ක්‍රියාවලියේ $N_2(g)$ සමඟ $H_2(g)$ ප්‍රතික්‍රියා කර $NH_3(g)$ සාදන ප්‍රතික්‍රියාව තාපදායක වේ.

c) ක්ලෝරිනීකරණයට පසුව ඔක්සිකරණය මගින්, රූටයිල්වලින් ඉහළ සංශුද්ධතාවයෙන් යුත් $TiO_2$ නිෂ්පාදනය සඳහා වූ කාර්මික ක්‍රියාවලිය පරිසරයට $CO_2$ පිට කිරීමට තුඩු දෙයි.

d) සල්ෆියුරික් අම්ලය නිපදවන ස්පර්ශ ක්‍රියාවලියේ දී $SO_3(g)$ ලබාදීම සඳහා $O_2(g)$ සමඟ $SO_2(g)$ අතර වූ ප්‍රතික්‍රියාව තාපාවශෝෂක ප්‍රතික්‍රියාවකි.

**(2024-40)**

11.

| | |
|---|---|
| ධාරා උෂ්මකයක කෝක් සහ $O_2(g)$ අතර ප්‍රතික්‍රියාවෙන් සෑදෙන $CO(g)$ ප්‍රමාණය උෂ්ණත්වය වැඩිවීමත් සමඟ වැඩි වේ. | කෝක් සමඟ $O_2(g)$ මගින් $CO(g)$ නිපදවන ප්‍රතික්‍රියාවට ධන එන්ට්‍රෝපි වෙනසක් ඇත. |

**(2024-49)**

12. පහත ප්‍රකාශ කාර්මික ක්‍රියාවලීන් හා සම්බන්ධ වේ. ඒවා අතුරෙන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

a) හේබර්-බොෂ් ක්‍රියාවලිය මගින් $NH_3$ නිෂ්පාදනයේ දී උත්ප්‍රේරක අවශ්‍ය නොවේ.

b) සබන් පිරිපහදු කිරීමේදී සිට්‍රික් අම්ලය භාවිතා කරයි.

c) ඩව් (Dow) ක්‍රියාවලිය මගින් Mg නිස්සාරණයේදී වායුගෝලයට $CO_2$ එක්වන්නේ හුණුගල් හෝ ඩොලමයිට් තාප වියෝජනයෙන් පමණකි.

d) පටල කෝෂ ක්‍රමයෙන් NaOH නිෂ්පාදනයේදී ප්‍රධාන අතුරු ඵලය HCl වේ.

**(2025-33)**

13. ස්පර්ෂ ක්‍රමය මගින් $H_2SO_4$ නිෂ්පාදනය හා සම්බන්ධ පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේ ද?

a) $2SO_2(g) + O_2(g) \rightleftharpoons 2SO_3(g)$ ප්‍රතික්‍රියාව තාප අවශෝෂක වේ.

b) මෙම ක්‍රියාවලිය සඳහා පොදුවේ භාවිතා කරනු ලබන උත්ප්‍රේකය Fe වේ.

c) $SO_2$ උත්ප්‍රේරක කුටීර හතරක දී $SO_3$ බවට පරිවර්තනය කෙරේ.

d) මෙම ක්‍රියාවලියේදී 1 atm ට වඩා වැඩි පීඩන භාවිතා නොවේ.

**(2025-40)**

14.

| | |
|---|---|
| $Na_2CO_3$ කාර්මිකව නිෂ්පාදනයේ දී ඇමෝනීකරණය, කාබොනීකරණයට පෙර සිදු කරයි. | ඇමෝනීකරණය කරන ලද බ්‍රයින් ද්‍රාවණයට $CO_2$ යැවූ විට, $(NH_4)_2CO_3$ ඉහළ සාන්ද්‍රණයකින් නිපදවේ. |

**(2025-49)**

**42.** <u>ශාක ආශ්‍රිත නිෂ්පාදන</u>

**1.**

| | |
|---|---|
| සගන්ධ තෙල්, ශාකමය ද්‍රව්‍යවලින් සාමාන්‍යයෙන් නිස්සාරණය කරන්නේ හුමාල ආසවනය මගින් ය. | සගන්ධ තෙල්වලට ජලයේ ඉහළ ද්‍රාව්‍යතාවයක් ඇත. |

**(2019-43)**

**2.** ශාක ප්‍රභව ආශ්‍රිත නිෂ්පාදිත හා සම්බන්ධව පහත කුමන ප්‍රකාශය / ප්‍රකාශ **නිවැරදි** ද?

a) ශාකවල වාෂ්පශීලි සංඝටකයන්හි සංකීර්ණ මිශ්‍රණ සගන්ධ තෙල්වල අන්තර්ගත වේ.

b) වාෂ්පශීලි ශාක තෙල්වලින් ජෛව ඩීසල් නිෂ්පාදනය කරනු ලැබේ.

c) ජෛව ඩීසල් නිෂ්පාදනයේ දී මෙතනෝල් භාවිත නොවේ.

d) ශාක ද්‍රව්‍ය පැසවීමෙන් නිෂ්පාදිත එතනෝල්, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් ලෙස සැලකේ.

**(2021-32)**

**3.** ජෛව ඩීසල් නිෂ්පාදනයෙහි ට්‍රාන්ස්එස්ටරීකරණ ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් පහත සඳහන් කුමන වගන්තිය / වගන්ති **නිවැරදි** වේ ද?

a) ග්ලිසරෝල් අතුරු ඵලයකි.

b) උත්ප්‍රේරක ලෙස භස්ම යොදා ගත නොහැක.

c) නිදහස් මේද අම්ල තිබීම ප්‍රතික්‍රියාවට හිතකර වේ.

d) සබන් සෑදීම නිසා උත්ප්‍රේරකයෙහි ක්‍රියාකාරිත්වය අඩු වේ.

**(2023-39)**

**43.** <u>පරිසර දූෂණය</u>

**1.** ජලාශවල ජලයේ ඇති ද්‍රාවිත ඔක්සිජන් මට්ටම සම්බන්ධයෙන් පහත සඳහන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

a) ජලයේ ද්‍රාවිත ඔක්සිජන්හි සංයුතිය වායුගෝලීය ඔක්සිජන්හි සංයුතියම වෙයි.

b) සුපෝෂණය හේතුවෙන් ජලයේ ද්‍රාවිත ඔක්සිජන් මට්ටම පහළ යයි.

c) ජලයේ ද්‍රාවිත ඔක්සිජන් මට්ටම වැඩි විට ජලයේ $H_2S$ නිපදවිය හැක.

d) ප්‍රභාසංස්ලේෂණය හරහා ජලජ ශාක ජලයේ ද්‍රාවිත ඔක්සිජන් මට්ටමට දායකත්වයක් දක්වයි.

**(2022-39)**

**2.** පහත සඳහන් කුමන වගන්තිය / වගන්ති **නිවැරදි** වේ ද?

a) පසට ෆොස්පේට් පොහොර එකතු කිරීම වායුගෝලයේ $N_2O$ මට්ටම ඉහළ යාමට දායක වේ.

b) හරකුන් සහ එවැනි ගොවිපොළ සතුන්ගේ ශ්වසනය වායුගෝලයේ $CO_2$ මට්ටම ඉහළ යාමට දායක වේ.

c) පොසිල ඉන්ධන දහනය වායුගෝලයේ $CH_4$ මට්ටම ඉහළ යාමට දායක වේ.

d) ජෛව ඉන්ධන දහනය වායුගෝලයේ $CO_2$ මට්ටම ඉහළ යාමට දායක නොවේ.

**(2023-37)**

**3.** පහත සඳහන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ **සත්‍ය** වේ ද?

a) කසළ බැහැර කිරීමට ක්‍රමවත් පිළිවෙළක් අනුගමනය කිරීම ගෝලීය උණුසුම අවම කිරීමට දායක වේ.

b) වන විනාශය අවම කිරීම ගෝලීය උණුසුම වැඩි වීමට දායක වේ.

c) ප්‍රවාහනයේ දී පිටවන NO වායුව ගෝලීය උණුසුම ඉහළ යෑමට දායක වෙයි.

d) ශීතකරණ සහ වායුසමන යන්ත්‍රවල භාවිත වන සිසිලන වායු ගෝලීය උණුසුම ඉහළ යෑමට දායක වෙයි.

**(2024-36)**

## 44. බහුඅවයවික

**1.**

| | |
|---|---|
| බේක්ලයිට් ආකලන බහුඅවයවකයක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. | බේක්ලයිට්වලට ත්‍රිමාන ජාල ව්‍යුහයක් ඇත. |

**(2022-50)**

**2.**

| | |
|---|---|
| තාපස්ථාපන බහුඅවයවක රත් කිරීම මගින් මෘදු කළ නොහැක. | තාපස්ථාපන බහුඅවයවකවලට ත්‍රිමාන දැලිසක් ලෙස සැකසුණු අණුක ව්‍යුහයක් ඇත. |

**(2024-50)**

## 45. වායු දූෂණය

**1.** වායුගෝලයේ කාබන්ඩයොක්සයිඩ් මට්ටම ඉහළයාම සම්බන්ධයෙන් පහත දැක්වෙන කුමන ප්‍රකාශය / ප්‍රකාශ **නිවැරදි** වේ ද?

a) එය මුහුදු ජලයේ ආම්ලිකතාව ඉහළයාමට දායක වේ.

b) එය ජල පද්ධතිවල කඨිනත්වය අඩු කරයි.

c) එය සූර්යාගෙන් පැමිණෙන UV කිරණ ප්‍රබලව අවශෝෂණය කරයි.

d) එය අම්ල වැසිවලට දායක නොවේ.

**(2019-36)**

**2.**

| | |
|---|---|
| CFC ඕසෝන් වියන භායනයට දායක වුවත් HFC වල දායකත්වය නොගිණිය හැකි තරම් කුඩාය. | ඉහළ වායුගෝලයට ළඟාවීමට පෙර HFC සම්පූර්ණයෙන් ම වියෝජනය වෙයි. |

**(2019-50)**

**3.** CFC, HCFC සහ HFC සම්බන්ධයෙන් පහත දැක්වෙන කුමන ප්‍රකාශය / ප්‍රකාශ **නිවැරදි** වේ ද?

a) CFC සහ HCFC යන සංයෝග කාණ්ඩ දෙකටම ඉහළ වායුගෝලයේදී (ස්තර ගෝලය) ක්ලෝරීන් මුක්ත බණ්ඩක නිපදවීමේ හැකියාව ඇත.

b) HFC සහ HCFC යන සංයෝග කාණ්ඩ දෙකටම ඉහළ වායුගෝලයේදී (ස්තර ගෝලය) ක්ලෝරීන් මුක්ත බන්ඩක නිපදවීමේ හැකියාව ඇත.

c) CFC, HCFC සහ HFC යන සංයෝග කාණ්ඩ තුනම ප්‍රබල හරිතාගාර වායූන් වේ.

d) CFC, HCFC සහ HFC යන සංයෝග කාණ්ඩ තුනම ඕසෝන් වියන ක්ෂය වීමට සැලකිය යුතු ලෙස දායක වේ.

**(2020-36)**

4.

| | |
|---|---|
| අධික වාහන තදබදය සහිත නගරයක, හොඳින් ඉර පායා ඇති දිනයක, ප්‍රකාශ රසායනික ධූමිකාව ප්‍රබලව දැකිය හැක. | ප්‍රකාශ රසායනික ධූමිකාව මුළුමනින්ම ඇතිවන්නේ රථවාහන අපවාහ පද්ධති මගින් පිටකරන සියුම් අංශු සහ ජල බිඳිති මගින් සූර්ය කිරණ ප්‍රකිරණ කිරීම හේතුවෙනි. |

**(2020-50)**

5. ගෝලීය උණුසුම ඉහළ යාම, අම්ල වැසි හා ප්‍රකාශ රසායනික ධූමිකාව යන පාරිසරික ප්‍රශ්න තුනටම දක්වන දායකවන වායුමය බැහැර කිරීමක්/නිපදවීමක් වන්නේ,
   1) පොසිල ඉන්ධන දහනය කරන වාහන වලින් පිටවන අපවාතයයි.
   2) ගල් අඟුරු බලාගාර වලින් පිටවන අපවාතයයි.
   3) වායුසමීකරණ හා ශීතකරණ අළුත්වැඩියාවේ දී පිටවන වායූන් වේ.
   4) නාගරික ඝන අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීමෙන් නිපදවෙන වායූන් ය.
   5) ජෛව ඉන්ධන දහනය කරන වාහනවලින් පිටවන අපවාතයයි.

**(2021-25)**

6. වාෂ්පශීලි හැලජනිකෘත හයිඩ්‍රොකාබන සහ ලෝක පාරිසරික ප්‍රශ්න අතර ඇති සම්බන්ධතාවය පිළිබඳව පහත දැක්වෙන කුමන ප්‍රකාශය / ප්‍රකාශ **නිවැරදි** වේ ද?
   a) CFC, HCFC සහ HFC යන තුනම ගෝලීය උණුසුම ඉහළ යාමට දායක වෙයි.
   b) CFC පරිවර්තී ගෝලයේ දී (troposphere) ක්ලෝරීන් මුක්ත ඛණ්ඩක නිපදවා ඕසෝන් වියන හායනයට දායක වෙයි.
   c) HFC ස්ථර ගෝලයේ දී (stratosphere) ක්ලෝරීන් මුක්ත ඛණ්ඩක නිපදවා ඕසෝන් වියන හායනයට දායක වෙයි.
   d) CFC සහ HCFC යන දෙකම ස්ථර ගෝලයේ දී (stratosphere) ක්ලෝරීන් මුක්ත ඛණ්ඩක නිපදවා ඕසෝන් වියන හායනයට දායක වෙයි.

**(2021-36)**

7.

| | |
|---|---|
| වායුගෝලයේ ඕසෝන් සෑදීම සඳහා පරමාණුක ඔක්සිජන් අත්‍යවශ්‍ය සාධකයකි. | වායුගෝලයේ පරමාණුක ඔක්සිජන් නිපදවනුයේ අණුක ඔක්සිජන් වියෝජනයෙන් පමණි. |

**(2021-50)**

8. ඕසෝන් ස්ථරය සම්බන්ධයෙන් පහත සඳහන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?
   a) එය ඉහළ වායුගෝලයේ (ස්ථර ගෝලය) ඕසෝන් පමණක් ඇති ප්‍රදේශයකි.
   b) එය වායුගෝලයේ පරමාණුක ඔක්සිජන් බහුලව පවතින ප්‍රදේශයකි.
   c) එය සූර්යාගෙන් මුක්ත වන පාරජම්බුල කිරණ පෘථිවි පෘෂ්ඨය කරා ළඟාවීම වළක්වන ප්‍රදේශයකි.
   d) එය ඕසෝන් බිඳවැටීම ක්ලෝරීන් මුක්ත ඛණ්ඩක යාන්ත්‍රණයක් හරහා පමණක් සිදුවන ප්‍රදේශයකි.

**(2022-37)**

**9.**

| | |
|---|---|
| වර්ෂා ජලයේ pH අගය 6.5 ලෙස වාර්තා වූ විට එය අම්ල වැසි ලෙස සැලකේ. | වර්ෂා ජලයේ pH අගය 7 ට අඩුවීම $SO_3$ සහ $NO_2$ ආම්ලික වායූන් ද්‍රවණය වීම නිසා පමණක් සිදුවෙයි. |

**(2022-47)**

**10.** ද්‍රව පොසිල ඉන්ධන දහනය වන වාහන අපවහනයක අඩංගු වන වායු සම්බන්ධයෙන් පහත සඳහන් කුමන ප්‍රකාශය / ප්‍රකාශ **නිවැරදි** වේ ද?

a) අපවහනයෙහි ප්‍රකාශ රසායනික ධූමිකාවට දායක වන වායු අඩංගු වේ.
b) අපවහනයෙහි ගෝලීය උණුසුමට දායක වන වායු අඩංගු වේ.
c) අපවහනයෙහි අම්ල වැසි සඳහා දායක වන වායු අඩංගු වේ.
d) අපවහනයෙහි ඕසෝන් වියන හායනයට දායක වන වායු අඩංගු වේ.

**(2023-40)**

**11.**

| | |
|---|---|
| HFC (hydrofluorocarbon) වායුව ඉහළ වායුගෝලයේ ඕසෝන් වියන හායනයට දායක නොවේ. | C – F බන්ධනය බිඳීමෙන් ඉහළ වායුගෝලයේ දී HFC ඉක්මනින් විනාශ වේ. |

**(2023-50)**

**12.** පහත සඳහන් කුමන ප්‍රකාශය / ප්‍රකාශ ස්තර ගෝලයේ ඕසෝන් වියනෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳව **සත්‍ය** වේ ද?

a) ඕසෝන් සෑදීමට $NO_2$ අවශ්‍ය වේ.
b) පරිවර්තී ගෝලයේ නිපදවෙන පරමාණුක ඔක්සිජන් ස්තර ගෝලයට ළඟාවීමෙන් පසු ඕසෝන් නිපදවයි.
c) ස්තර ගෝලයේ ඇති ඕසෝන් මට්ටම වසර පුරා විචලනය වෙයි.
d) ඕසෝන් සෑදීමට අධෝරක්ත කිරණ අත්‍යවශ්‍ය වේ.

**(2024-37)**

**13.** වායුගෝලීය ඕසෝන් ගැන මින් කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය ද?

a) වැඩිම ඕසෝන් සාන්ද්‍රණය ඇත්තේ පොළොව මට්ටමේ ය.
b) ස්ථර ගෝලීය ඕසෝන් මිනිස් ජීවිත අරක්ෂා කරයි.
c) පොළොව මට්ටමේ ඇති ඕසෝන් සෑදීමට මෝටර් රථ විමෝචනයන් දායක වේ.
d) ඕසෝන් වියනේදී ඕසෝන් සෑදීම හා විනාශ වීම UV කිරණ ඇති විට සිදු වේ.

**(2025-37)**

**14.**

| | |
|---|---|
| වායුගෝලීය ජල වාෂ්ප ගෝලීය උණුසුම ඉහළ යාමට දායක වේ. | ජල වාෂ්ප හරිතාගාර වායුවකි. |

**(2025-45)**